පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 10 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- චිත්‍ර කලාව I ,

පාසලේ නම : ..........................................................................................................

ඇතුළත්වීමේ අංකය : ................................

**කාලය පැය 01 යි.**

❖ සියලුම ප්‍රශ්න වලට **මෙම පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

- පහත දැක්වෙන ඡායාරූපය ඇසුරු කරගෙන අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවල හිස්තැන් පුරවන්න.



1. ප්‍රධාන ලෙන් පහකින් සමන්විත මෙම විහාර සංකීර්ණය ........................................................................................ නමින් හැඳින්වේ.
2. මෙම ලෙන් විහාරය ක්‍රි. ව. පළමු සියවසේ දී ........................................................................................ රජු විසින් ඉදිකරන ලද්දකි.
3. මෙහි දක්නට ලැබෙන "සූවිසි විවරණය" සිතුවම ........................................................... යුගයේ කලා ලක්ෂණවලින් යුක්ත වේ.
4. මෙහි සිතුවම් ඇඳීමේ ගෞරවය ........................................................................................ සිත්තර පරම්පරාවට හිමිවේ.
5. මෙහි වියන්තලයේ අඳ ඇති සුවිසල් සිතුවම ........................................................................................ නමින් හැඳින්වේ.

- අංක **6** සිට **10** තෙක් දී ඇති ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

6. පෙරිය තම්බි සුබ්‍රමණියම් ශිල්පියාගේ "ඉනුවිල් පරරාසසේකර කෝවිලේ" දැකිය හැකි කොටස් තුනකින් යුත් සිතුවම හඳුන්වන නම කුමක් ද?......................................................................
7. රෝමයේ සිස්ටයින් දෙව් මැදුරේ ඇති "ආදම් මැවීම" නම් සිතුවම නිර්මාණය කළ ශිල්පියා කවුද? ......................................
8. ගම්පොළ යුගයේ ඉදිවූ ලංකාතිලක විහාරයේ ඇඳ ඇති සිතුවම් අයත් වන්නේ කුමන යුගයකට ද? ..........................................
9. "රත්වත්තේ අලංකාරය" කුමන ජන කලාවක දක්නට ලැබෙන සැරසිල්ලක් ද? ........................................................................
10. සිතුවමක දුර, ළඟ දැක්වීමේ දී භාවිතා කරන ශිල්ප ක්‍රමය කුමන නමකින් හැඳින්වේද? ........................................................

- අංක **11** සිට **15** තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඊට **යටින් ඉරක් අඳින්න.**

11. ඩේවිඩ් පේන්ටර් ශිල්පියාගේ "යහපත් සමරිතානුවරයා" නම් සිතුවම දක්නට ලැබෙනුයේ,

    (1) ජාතික කලාභවනේ ය.
    (2) මහනුවර ත්‍රිත්ව දෙව්මැදුරේ ය.
    (3) බොරැල්ලේ ගෝතමී විහාරයේ ය.
    (4) නව කැලණි විහාරයේ ය.

12. මැදවල ටැම්පිට විහාරයේ ඇති කුඩා තීරු සංරචන සිතුවම් අතරින් ප්‍රධාන තැනක් ගන්නේ,

    (1) උරග ජාතකය හා නලපාන ජාතකයයි.
    (2) වෙස්සන්තර ජාතකය හා මහාකපි ජාතකයයි.
    (3) සුතසෝම ජාතකය හා නලපාන ජාතකයයි.
    (4) උරග ජාතකය හා සුතසෝම ජාතකයයි.

13. නිර්මාණාත්මකව අඳින ලද සත්ත්ව රූපයක් ඒකකයක් ලෙස ගෙන කිසියම් රටාවකට අනුව පැතිරී යන අයුරින් පිටපත් කිරීමෙන් නිර්මාණය වන්නේ,

    (1) මුළුතල මෝස්තරයකි.
    (2) සමමිතික මෝස්තරයකි.
    (3) ව්‍යාප්ත මෝස්තරයකි.
    (4) අවිධිමත් මෝස්තරයකි.

14. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් හමු වූ අං සහිත දෙවියා මුද්‍රාවෙන්,

    (1) අං සහිත ගවයකු නිරූපිත ය.
    (2) ශිව දෙවියන්ගේ එක් වේශයක් වන පශුපති නිරූපණය වේ.
    (3) නන්දි ගවයා සංකේතවත් වේ.
    (4) ඉන්දු නිම්න වැසියන්ගේ ජවසම්පන්න බව නිරූපණය වේ.

15. ද්විතීය වර්ණ ලෙස හඳුන්වන්නේ,

    (1) රඹ, දම්, සහ කොළ යන වර්ණයන් ය.
    (2) නිල්, රතු, සහ කහ යන වර්ණයන් ය.
    (3) රඹදම්, රඹකොළ, සහ දම්කොළ යන වර්ණයන් ය.
    (4) කළු, සුදු, සහ අළු යන වර්ණයන් ය.

- අංක **16** සිට **20** තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ **සම්පූර්ණ** වාක්‍යය බැගින් ලියන්න.

16. රූපාක්ෂර :..............................................................................................................................

..............................................................................................................................

17. නියඳ කෙඳි :..............................................................................................................................

..............................................................................................................................

18. අල්පනාව :..............................................................................................................................

..............................................................................................................................

19. ටෙම්පරා :..............................................................................................................................

..............................................................................................................................

20. මිනරව් :..............................................................................................................................

..............................................................................................................................

- අංක **21** සිට **25** තෙක් දී ඇති රූප සටහන් කොටස් වලට සමීප සබඳතාවක් දක්වන රූප සටහන ඉදිරියේ ඇති A,B,C,D,E යන ඒවා අතුරෙන් තෝරා එහි අක්ෂරය **තිත් ඉරි මත** ලියන්න.

21.  (,.............)

 A

22.  (,.............)

 B

23.  (,.............)

 C

24.  (,.............)

 D

25

.  (,.............)

 E

- අංක **26** සිට **30** තෙක් දී ඇති වැකිවල හිස්තැනට වඩාත් සුදුසු වචනය යොදා සම්පූර්ණ කරන්න.

26. ඉන්දු නිම්න ශිෂ්ඨාචාරයට අයත් "නළඟන" මූර්තිය ........................................ ජාතික කෞතුකාගාරයේ ප්‍රදර්ශනය කෙරේ.

27. "ඇතීනා දෙවඟනගේ රුව" දක්වෙන ග්‍රීක මූර්තිය ................................................................... නම් ශිල්පියාගේ නිර්මාණයකි.

28. "යාලි" රුව නිර්මාණය කිරීම සඳහා සිංහයා, හස්තියා, .......................................... යන සතුන්ගේ කොටස් භාවිතා කර ඇත.

29. බුදුන් වහන්සේ වැඩ සිටි මිණි පළඟ තැන්පත් කොට ............................................................... රජු විසින් කැලණි ස්තූපය ඉදි කර වූ බව මහවංශයේ සඳහන් වේ.

30. දීප්තිමත් නිල් වර්ණය සාදා ගැනීම සඳහා ................................................................. පාෂාණ විශේෂය භාවිතා කර ඇත.

- අංක **31** සිට **35** තෙක් දී ඇති ප්‍රශ්නවලට F,G,H,I,J යන රූපසටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.


F


G


H


I


J

31. F අක්ෂරයෙන් දැක්වෙන සිතුවම ඇඳ තිබුණු සිව දේවාලයේ නම කුමක් ද? ..............................................................................

32. G අක්ෂරයෙන් දැක්වෙන ග්‍රීක මූර්ති කලාවේ අගනා නිර්මාණය කුමන නමකින් හැඳින්වේ ද? ..................................................

33. H අක්ෂරයෙන් දැක්වෙන විශිෂ්ට සිතුවම නිර්මාණය කළ පුනරුද යුගයේ බිහිවූ ශ්‍රේෂ්ට ශිල්පියා කවුද? .................................

34. I අක්ෂරයෙන් දැක්වෙන නා ලොවට අයත් යැයි සැලකෙන නිර්මාණය කුමන සැරසිලි ගණයකට අයත්වේද ? ...................

35. J අක්ෂරයෙන් දැක්වෙන තීබ්ස්වල නෙබාමුන් (Nebamun) සොහොන් ගැබෙන් සොයාගත් සිතුවම අයත් සේ සැලකෙන්නේ කුමක් යුගයට ද?......................................................................................

- මෙහි දැක්වෙන නිර්මාණය හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි අංක **36** සිට **40** තෙක් දී ඇති උප මාතෘකාවලට අදාළ ව අර්ථවත් සම්පූර්ණ වාක්‍යය **පහක්** ලියන්න. (තනි වචනයෙන් පිළිතුරු සැපයීම ලකුණු **නොලැබීමට** හේතුවක් වනු ඇත.)



36. ශිල්පියා පිළිබඳව : ..................................................................................................................................................
..................................................................................................................................................

37. තේමාව පිළිබඳව :, ..................................................................................................................................................
..................................................................................................................................................

38. වර්ණ භාවිතය පිළිබඳව : ..................................................................................................................................................
..................................................................................................................................................

39. සංරචනය කර ඇති අයුරු: ..................................................................................................................................................
..................................................................................................................................................

40. ප්‍රකාශිත හැඟීම් : ..................................................................................................................................................
..................................................................................................................................................

( ලකුණු 40)

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 10 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- චිත්‍ර - II,

පාසලේ නම : ..............................

ඇතුළත්වීමේ අංකය : ..............................

**කාලය පැය 02යි**

සැලකිය යුතුයි.

- ඔබේ **විභාග අංකය** උත්තර පත්‍රයේ ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයේ පැහැදිලිව ලියන්න.
- උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට ද්‍රව මාධ්‍ය භාවිතා කරන සිතුවම් වියළී තිබිය යුතුය. තෙත චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකිය.
- දියසායම්, පෝස්ටර් සායම්, ටෙම්පරා සායම්, පැස්ටල් හෝ අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් භාවිතා කළ හැකිය.
- ද්‍රව්‍ය සමූහය 73cm පමණ උස පැතලි ඩෙස්ක් එකක් මත තැබීමට ශාලාධිපතිවරුන්ට උපදෙස් දී ඇත.

---

## ❖ නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය.

- ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කරන්න.

1. රේඛා මගින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න. මේ සඳහා ඔබට සපයා ඇති A 4 ප්‍රමාණයේ සුදු කඩදාසිය භාවිතා කරන්න.
2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ වර්ණ කරන්න. මේ සඳහා සපයා ඇති විශේෂ චිත්‍ර කඩදාසිය භාවිතා කරන්න.

- **ඉහත 1 සහ 2 චිත්‍ර දෙක ම එකට අමුණා ශාලාධිපතිට භාර දෙන්න.**
- ඔබේ චිත්‍රය ඇගයීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් වන බව සලකන්න.

**❖ නිදහස් රේඛා අධ්‍යයනය**

1. මුල් කඩදාසියේ කරනු ලබන පූර්ව රේඛා අධ්‍යයනයේ දී දක්වා ඇති කුසලතා (ලකුණු 05)

**❖ වර්ණ චිත්‍රය**

2. ද්‍රව්‍ය සමූහය තලය මත කලාත්මකව සම්පිණ්ඩනය කිරීම. (ලකුණු 05)
3. පරිමාණ, පර්යාවලෝක රීති හා ත්‍රිමාණ ලක්ෂණ පිළිබඳ අවබෝධය. (ලකුණු 05)
4. දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය හා ගති ලක්ෂණ දැක්වීම. (ලකුණු 05)
5. වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතා (ලකුණු 05)
6. උචිත වර්ණවත් පසුබිමක් යෙදීම හා සමස්ත නිමාව (ලකුණු 05)

සැලකිය යුතුයි

- ද්‍රව්‍ය තබා ඇති ලෑල්ල විශාල ලෙස ඇඳීම අවශ්‍ය නොවේ. ලෑල්ලේ පරිමාණය ද්‍රව්‍ය සමූහයට ගැළපෙන අයුරින් වෙනස් කර ඇඳීමට ඔබට අවසර ඇත.

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

# තෙවන වාර පරීක්ෂණය - 2023

| ශ්‍රේණිය |
|---|
| 10 |

විෂය :- චිත්‍ර - III,

පාසලේ නම : ..............................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය පැය 02

❖ **සැලකිය යුතුයි :**

- ඔබ ඇඳිය යුත්තේ එක් චිත්‍රයක් පමණි.
- ඔබේ නම ඇතුළත්වීමේ අංකය හා අදාළ ප්‍රශ්න අංකය උත්තර පත්‍රයේ පසු පිටේ වම්පස ඉහළින් පැහැදිලි ව ලියන්න.
- දියසායම්, පෝස්ටර් සායම්, පැස්ටල් ඇතුළු අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් වර්ණ කිරීම සඳහා භාවිතා කළහැකිය.

---

❖ **"අ"කොටස" ආකොටස හෝ"ඉ" කොටසින් එක් මාතෘකාවක් පමණක් තෝරා ගන්න.**

- **"අ" කොටස - චිත්‍ර සංරචනය.**

01. නගරයක ජනාකීර්ණ වීදියක්.

02. ගංගාවක ඔරු පැදීමේ තරගයක්.

03. නිවසක් ඉදි කරන කම්කරුවන්.

04. නිදැල්ලේ සැරිසරන ගව රංචුවක්.

- **"ආ" කොටස - මෝස්තර නිර්මාණ.**

5. ආගමික උත්සව අවස්ථාවක දී භාවිතා කළ හැකි ධජ පතාකයක් නිර්මාණය කරන්න.

6. ළදරු ඇඳුම් රෙද්දක් සඳහා සුදුසු සරල සත්ත්ව හැඩතල යොදා ගැනිමින් ව්‍යාප්ත මෝස්තරයක අඟල් 8 x 8 ප්‍රමාණයේ කොටසක් නිර්මාණය කරන්න. ව්‍යාප්ත වන ආකාරය පිළිබඳ ව සැලකිලිමත් වන්න.

7. අඩි 8 x 6 ප්‍රමාණයේ ඇඳ ඇතිරිල්ලක් සඳහා මෝස්තරයක් නිර්මාණය කරන්න.

- **"ඉ" කොටස - ග්‍රැපික් චිත්‍ර.**

08. " කාන්තා හිංසනය පිටු දකිමු " තේමාව යටතේ පෝස්ටර් චිත්‍රයක් නිර්මාණය කරන්න..

09. දේශීය පලතුරු බීම බෝතලයකට සුදුසු ලේබලයක් නිර්මාණය කරන්න.

10. "මව් පිය ගුණ ගායනා" නමින් පළවන කවි පොතක් සඳහා සුදුසු පිට කවරයක් නිර්මාණය කරන්න.

(ලකුණු 30)

2023 තෙවන වාර පරීක්ෂණය
10 ශ්‍රේණිය චිත්‍ර කලාව
I පත්‍රය පිළිතුරු

01. දඹුලු විහාරය
02. වලගම්බා /වට්ටගාමිණී අභය
03. මහනුවර
04. නීලගම
05. මාරපරාජය
06. අගස්තියර් හා විනයගර්
07. මයිකල් ආන්ජිලෝ
08. මහනුවර යුගය
09. පැදුරු කර්මාන්තය
10. පර්යාලෝකය
11. (2) මහනුවර ත්‍රිත්ව දෙව්මැදුරේ ය.
12. ලකුණක් ලබා දෙන්න ( නිවැරදි පිළිතුර සඳහන් වී නැත )
13. (3) ව්‍යාප්ත මෝස්තරයකි.
14. (2) ශිව දෙවියන්ගේ එක් වේශයක් වන පශුපති නිරූපණය වේ.
15. (1) රඹ, දම්, සහ කොළ යන වර්ණයන් ය.

**(අංක 16 සිට 20 දක්වා දී ඇති වචනයේ අර්ථය පැහැදිලි වනසේ පිළිතුරු ලියා ඇති නම් ලකුණු ලබා දෙන්න.)**

16. ඊජිප්තු සිතුවම් අතර සටහන් කර ඇති අක්ෂර විශේෂයකි./මෙම රූපාක්ෂර හයිරොග්ලිපික්ස් යන නමින් හැඳින්වේ.
17. පැදුරු කලා කර්මාන්තයේ දී නියඳ කෙඳි මාධ්‍ය ලෙස ගෙන කළාල නිර්මාණය කෙරේ.
18. පොල් තෙල් පහනක් තබන ස්ථානය අලංකාර කිරීම සඳහා යොදුනු ලබන සැරසිල්ලකි.
19. වියළි බදාමය මත බන්දන මාධ්‍යයක් (මැලියම්) සමඟ මිශ්‍ර කර ගන්නා ලද වර්ණවලින් ඇඳීමේ ක්‍රමය වේ.
20. ඉස්ලාම් දේවස්ථාන දෙපස ඇති කුලුණු මින් හැඳින්වේ./ ඉස්ලාම් පල්ලිවල දක්නට ලැබෙන ගෘහ නිර්මාණ අංගයකි.
21. D
22. A
23. E
24. B
25. C
26. නවදිල්ලි
27. පීඩියස්
28. අශ්වයා
29. මණි අක්බිත නා
30. ලැපිස් ලැසුලි
31. සට්ටනාදර් ශිව දේවාලය
32. ලැඹකුත් මූර්තිය
33. ලියනාඩෝ ඩාවින්චි
34. උද්භිද
35. නව රාජධානි යුගය (ක්‍රි .පූ. 1580 - 1350 අතර )
36. සෝලියස් මෙන්ඩිස් ශිල්පියා විසින් අඳින ලද සිතුවමකි.
37. හේමමාලා කුමරිය හා දන්ත කුමරු ශ්‍රී දළදා වහන්සේ ලංකාවට වැඩම කරවීම.
38. ත්‍රිමාන ලක්ෂණ මතුවන සේ සංගත වර්ණ මාලාවක් භාවිතා කර ඇත. / අඳුරු කහ, දුඹුරු, කළු, සුදු,ආදි වර්ණවල ප්‍රභේද භාවිතා කර ඇත. .
39. විශාල අවකාශයක් මත මානව රූප ලාලිත්‍යමය ඉරියව්වලින් යුතුව සංරචනය කර ඇත.
40. ආගමික භක්තිය දනවන අයුරින් සිතුවම් කිරීම. /බුද්ධාලම්භන ප්‍රීතිය දනවන අයුරින් සිතුවම් කිරීමට ශිල්පියා සමත්ව ඇත.


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න